ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ

# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය

දුරකථනය: +94 (1) 249-8100 ෆැක්ස්: +94 (1) 244-9070
විද්‍යුත් තැපැල: VanHornNT@state.gov වෙබ්: http://lk.usembassy.gov

නිවේදන අංක: 20190516

**එක්සත් ජනපදයෙන් ශ්‍රී ලංකාවට නවතම නාවික යාත්‍රාවක් ලැබෙයි**

මැයි 16, කොළඹ: හවායි සිට පැය 42ක නාවික ගමනක් ගෙවා ගෙන එක්සත් ජනපද වෙරළ ආරක්ෂක බලකාය විසින් තෑගී කළ අධි දැරුම් ශක්තියක් ඇති නෞකාවක් මැයි 12 දින කොළඹට සේන්දු විය. 2018 අගෝස්තු මස 27 දින හොනලුලුහිදී පැවැත්වූ උත්සවයකදී මෙම නෞකාව ශ්‍රී ලංකා නාවික හමුදාවට නිළ වශයෙන් භාරදුනි. නෞකාව භාරදීමෙන් පසුව එහි අලුත්වැඩියා සහ වැඩි දියුණු කිරීම් සිදුකළ අතර, ශ්‍රී ලාංකික කාර්ය මණ්ඩලය පුහුණු කිරීමද සිදුකරන ලදී.

තම ආරක්ෂාව සහ සෞභාග්‍ය ළඟා කරගත හැකි ස්වෛරී ශ්‍රී ලංකාවක් වෙනුවෙන් එක්සත් ජනපදයේ ඇති කැපවීම මේ මගින් පිලිබිඹු වන බව ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපතිනී ඇලෙයිනා ටෙප්ලිට්ස් පැවසීය. "ඉන්දු-පැසිෆික් කලාපය සියලු ජාතීන්ට නිදහස් හා විවෘතව පැවතිය යුතුය." මීටර් 115ක් දිග මෙම නෞකාව ශ්‍රී ලංකාවට ලබා දීමට නියමිත දෙවැනි එක්සත් ජනපද වෙරළ ආරක්ෂක නෞකාව වන අතර එය ශ්‍රී ලංකා නාවික හමුදා බල ඇණියට අයත් විශාලතම නෞකාව වනු ඇත. නාවික හමුදාපති වයිස් අද්මිරාල් පියල් ද සිල්වා, නාවික කාර්ය මණ්ඩල ප්‍රධානී අද්මිරාල් නිශාන්ත උළුගෙතැන්න, නාවික හමුදා මුලස්ථානයේ සහ බටහිර නාවික බණ්ඩයේ වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් කපිතාන් රෝහිත අබේසිංහ සහ 22ක් වූ කාර්ය මණ්ඩලයත් 111ක් වූ භට කණ්ඩායමත් පිළිගනු ලැබීය. නැව පැමිණීමෙන් අනතුරුව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් මූලික නෞකා නිරීක්ෂණයක් සිදුකරන ලදී. නුදුරු දිනකදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් නෞකාව අධිකාරිත්වයට පත් කිරීමෙන් අනතුරුව එයට ශ්‍රී ලාංකික නාමයක් ලැබෙනු ඇත.

මෙම නෞකාව ශ්‍රී ලංකාව වටා ගැඹුරු මුහුදේ මුර සංචාරය හා නිරීක්ෂණ මෙහෙයුම් සඳහා සහ සමුද්‍රීය ආරක්ෂාව, මුදා ගැනීමේ මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් යොදවනු ඇත. නිදහස් හා විවෘත ඉන්දු පැසිෆික් කලාපයක් ප්‍රවර්ධනය කිරීමේ ශ්‍රී ලංකාවේ සහ එහි හවුල්කරුවන්ගේ ප්‍රයත්නයට එක්සත් ජනපදය සහාය වනු ඇත.